tamilguru.lk



# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

සංශෝධනයයි

**සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2024**

අංක 2372 දරන 2024 පෙබරවාරි මස 16 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුරුවලට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2024 විභාග නිවේදනයේ 5(vi) හා 08 ඡේදයන්හි අයදුම්පත් කැඳවන අවසන් දිනය, **2024.05.17** දින ලෙස මෙයින් සංශෝධනය වේ. එමෙන් ම අනෙකුත් සංශෝධන පහත පරිදි වේ.

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුරුවලට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2024 ජූලි මාසයේ දී කොළඹ දී පවත්වනු ලැබේ. විභාගය පවත්වන දිනය හා ස්ථානය යථා කාලයේදී දන්වනු ලැබේ.

ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ III ශ්‍රේණියේ පවතින පුරප්පාඩු පිරවීමට හැකිවන සේ ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයෙන් පරිබාහිරව මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුරු **97ක්** සඳහා බඳවා ගැනීමට පහත පරිදි නියමිත සුදුසුකම් සම්පූර්ණ කළ අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. (පුරප්පාඩු සියල්ලම හෝ කිසියම් ගණනක් නොපිරවීමට පත්වීම් බලධාරියාට බලය ඇත.)

| | | |
|---|---|---|
| 01 | මැනුම් විද්‍යා උපාධිධාරීන් | තනතුරු 87 |
| 02 | අනෙකුත් උපාධිධාරීන් | තනතුරු 10 |

තව ද අංක 2372 දරන 2024 පෙබරවාරි මස 16 වන දිනැති ඉහත *ගැසට්* පත්‍රයේ 1.5 හි සඳහන් වයස සීමාව පහත පරිදි සංශෝධනය වේ.

1.5.1 අවම වයස් සීමාව අවුරුදු 22,
1.5.2 උපරිම වයස් සීමාව අවුරුදු 35,

''ඒ අනුව **2002.02.16** දිනට හෝ එදිනට පෙර හා **1989.02.16** දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.'' (එනම් **1989.02.16 සිට 2002.02.16** යන දින දෙක ද ඇතුළුව ඒ අතර කාලය තුල උපන් දිනය සඳහන් අයට මේ සඳහා අයදුම් කළ හැක.)

**සටහන :**

අංක 2372 දරන 2024 පෙබරවාරි මස 16 වන දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුරුවලට බඳවාගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2024 සඳහා දැනටමත් අයදුම් කර ඇති වයස අවුරුදු 28ට වැඩි හා වයස අවුරුදු 35ට අඩු අයදුම්කරුවන් නැවත අයදුම් කිරීම අවශ්‍ය නොවේ.

ඩබ්ලිව්. සුදත් එල්. සී. පෙරේරා,
සර්වේයර් ජනරාල්.

2024 මැයි මස 03 වැනි දින,
මිනින්දෝරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

05-22